# අතුල දස්සන දහම් පාසල

*We deliver the Buddhism to young Children*

## NEWS LETTER

ඇසළ කලාපය 2014

<u>අනුශාසක හිමියන්ගේ පණිවුඩය</u>

"පුත්තා වත්ථු මනුස්සානං"

දෙවිකෙනෙකු අහපු ප්‍රශ්නයකට පිලිතුරු දුන් බුදු පියාණන් වහන්සේ දේශනා කලේ මෙලොව සිටින මිනිසුන්ට මිහිපිට ඇති වටිනාම වස්තුව, සම්පත දරුවන් බවයි.

එහෙයින් වැඩිහිටින් වූ ඔබේ පරම යුතුකම තම දරු සම්පත සම්පතක් විදිහටම සමාජයට දායාද කිරීමය. මල්වගේ අපේ දරුවන් ඒ අයගේ ජීවිතයට පණිවිඩ ලබාගන්නා මාධ්‍ය දෙක ඇස් දෙක සහ කන් දෙකයි. අපට ලොකු වගකීමක් තිබෙනවා. ඒතමයි දරුවන්ගෙ ඇස් දෙකයි කන් දෙකයි පරිස්සම් කරන එක. මේවගේ රටක ඒක ලේසි නැහැ.

අපේ දෙමවුපියෝ ඒ අයගෙ වගකීම හරියට කළ නිසා නේද, අද අපි සමාජයට වැඩදායි අර්ථවත් මිනිසුන් ලෙස ජීවත් වෙන්නෙ.

දහම් පාසල කියන්නෙ දරුවෙකුට දර්මය පමණක් ඉගෙනගන්නා තැනක් නොව. අම්මට තාත්තට වැඩිහිටියන්ට ගරු කරන්න, සලකන්න, උපස්ථාන කරන්න වගේම සමාජීය දැනුම, ඉදිරිපත්වීම, නායකත්වය, පෞර්ෂය, සංවිධාන ශක්තිය, ජීවිතයේ ප්‍රශ්නයක් පැමිණිවිට තමා විසින්ම විසදාගැනීමේ හැකියාව වැනි උසස් ගුණාංග ඉගෙනගන්නා තෝතැන්නකි.

තෙරුවන් සරණයි............

අති පූජ්‍ය වදුරඹ කස්සප නාහිමි
එක්සත් රජධානියේ ප්‍රධාන සංඝ නායක

දහම් පාසල් දරු දැරියන් වෙනුවෙන් වසන්ත නිවාඩු සමයේ අධ්‍යාපන සහ විනෝද චාරිකාවක් සංවිධානය කිරීමට දහම් පාසල් සංවර්ධන සමිතිය බලාපොරොත්තුවේ. ඒ සඳහා පහත සඳහන් කරුණු ලබා දෙන ලෙස දෙමාපියන්ගෙන් කාරුණිකව ඉල්ලා සිටිමු.

1. සුදුසු දිනයන් 2014 අගොස්තු මස 09 සහ 16

2. සුදුසු ස්ථාන

3. එදින වැඩසටහන

ඔබගේ යෝජනා අපගේ ඊ-මේල් ලිපිනයට යොමු කරන්න.

<u>ඉදිරි වැඩසටහන්</u>

- ✓ ඇසළ සිල් වැඩසටහන 13/07/2014 දින පංසල් පරිශ්‍රයේ දී පැවැත්වේ.
- ✓ දහම් පාසල් සංවර්ධන සමිතියේ මහා සභා රැස්වීම 02/08/2014 සවස 5.00 ට පැවැත්වීමට නියමිතය.
- ✓ නව අධ්‍යන වසරට ළමුන් බඳවා ගැනීම් දැන් සිදු කෙරේ. ඔබගේ අයදුම්පත් 06/09/2014 පෙර භාර දිය යුතුයි.
- ✓ ලන්ඩන් එල්ලේ සැණකෙළිය අගොස්තු මස 24 වන ඉරු දින උදේ 9.00 සිට Little Harlington Playing Fields, Sipson Lane, Hayes, UB3 5EU දී පැවැත්වේ.

<u>දහම් පාසල් සිසු සිසුවියන් දහම් පාසල වෙත පැමිණිය යුතු පිළිවෙල</u>

- ➢ සිසු සිසුවියන් සුදු වතින් සැරසී පැමිණිය යුතුයි.
- ➢ ගැහැණු ළමුන් සුදු ලෙගින් එකක් ඇඳිය යුතුයි.
- ➢ කොපි පොත් 2ක් සහ ලිවීමට අවශ්‍ය උපකරන රැගෙන ආ යුතුයි.
- ➢ හැකිනම් මල් පහන් හඳුන්කූරු ආදිය රැගෙන එන්න.

*<u>අතුල දස්සන දහම් පාසලේ ඇදුරු මඩුල්ල</u>*

- අති පූජ්‍ය වදුරඹ කස්සප නාහිමි
- ශාස්ත්‍රවේදී කළුබංඩා වන්නකු මයා
- සීවලි ලියදිපිට මයා
- නිර්මා ධර්මවර්ධන මිය
- සන්ධ්‍යා විජේගුණවර්ධන මිය

## දහම් පාසලේ ප්‍රධානාචාර්ය තුමාගේ පණිවුඩය

"යො ධමමං පස්සති සො මං පස්සති"

යමෙකු ධර්මය දකී ද හෙතම බුදුන්වහන්සේ දකී. අතුල දස්සන දහම් පාසලේ ප්‍රථම ප්‍රවෘත්ති පත්‍රිකාවට පණිවුඩයක් ලබා දීමට අවස්ථාවක් ලබා දීම පිළිබඳව දහම් පාසලේ සංවර්ධන සමිතිය වෙත මා ස්තුති වන්ත වෙමි.

අප දහම් පාසල ආරම්භ කොට දැනට අවුරුදු 3ක් පමණ වේ. අප දහම් පාසලේ එකම අරමුණ එංගලන්තයේ වෙසෙන බෞද්ධ දරුවන්ට දහම් අධ්‍යාපනය මෙන්ම ලාංකීය සංස්කෘතිය, චාරිත්‍ර වාරිත්‍ර උගන්වා යහපත් ගුණගරුක ළමා පරපුරක් බිහි කිරීමයි. දැනට දහම් පාසලේ ඉගෙණ ගන්නා ශිෂ්‍ය ශිෂ්‍යාවන් සෑම දෙනෙක්ම මල් පහන්, ගිලන්පස බුදුපියාණන්ට පූජා කොට තනියෙන් ගාථා ශබ්දනගා කියවා බුද්ධ වන්දනා කිරීමේ හැකියාවක් ප්‍රගුණ කොට තිබෙනවා. දෙමාපියන්ට ගරු කරන වැඩිහිටියන්ට ගරු කරන කාරුණික ළමා පිරිසක් අප දහම් පාසල තුලින් බිහි කොට තිබෙනවා. ඒ සඳහා ළමුන්ගේ දෙමාපියන්ගේද සහයෝගය අප වෙත නොඅඩුව ලැබෙන බව මතක් කරන්නේ ඉතා සතුටිනි.

මා ඉහත සඳහන් කළ ගාථාව දෙසට හැරෙමු. යමෙකු ධර්මය දකීද හෙතෙම බුදුන්වහන්සේ දකී. ඉතිං ඔබේ දරුවාටත් බුද්ධ ධර්මය කියා දෙන්න. ජාතිය ගැන අපේ සංසකෘතිය ගැන ඉගෙණ ගැනීමට අවස්ථාව ලබා දෙන්න. තමන්ගේ මව් බස උගන්වන්න. පංසල විහාරය කියන්නේ මොකක්ද කියලා කියා දෙන්න. ධර්මයෙන් තොරව හඳන දරුවාගෙන් නිසිදු පලක් නොවේ. තමා දෙමාපියෙක් හැටියට තමාගේ වගකීම නිසියාකාරව ඉටු කරන්න. තමාගේ කුඩා කිරි සප්පයන් බටහිර තාලයට හදන්න එපා. ඉන් කවදා හෝ ඔබ අනාගතයේදී පසුතැවිලා වෙනු ඇත. දහම් පාසල බල බලා අහක බලාගෙන යන්න එපා. ඔබේ දරුවාටත් බුද්ධ ධර්මයේ ඇති වටිනාකම උගන්වන්න. ආගම දහම ජාතික හැඟීම උගන්වන්න. එවිට ඔබ දෙමාපියෙක් ලෙස තම දරුවන් වෙනුවෙන් වගකීම් ඉටු කළා වනු ඇත. ඔබේ දරුවා කුඩා කළ පටන් බුදුදහම ආශ්‍රයෙන් හදා ගතහොත් එය ඉතාම වටිනා දෙයක් ලෙසයි මා දකින්නේ. ඒ නිසාවෙන් ඔබේ දරුවාද දහම් පාසල වෙත යොමු කොට කාරුණික, ගුණගරුක දෙමාපියන්ගේ අගය දන්නා පුරවැසියෙකු කිරීමට උත්සහ දරන්නේ නම් එය ඔබ බුදුරජණන් වහන්සේ දැක්කා හා සමානයි.

ලිපිය කුරුටු ගෑවේ,
කළුබංඩා වන්නකු

## දහම් පාසලේ වසන්ත සමයේ නිවාඩු දිනයන්

**2014 අගොස්තු 23 සහ 30.**

**06 සැප්තැම්බර් 2014 නව අධ්‍යන වසර ආරම්භ වේ.**

## දහම් පාසල් ළමුන්ගේ නිර්මාණ

Our Dhamma School

1. In our dhamma school we learn lots of Buddhism.
2. We offer drinks, candles, flowers and Gilampasa.
3. We respect the teachers.
4. We talk nicely.
5. We learn the five precepts.
6. We behave nicely.

Theshara Arandara

### අතුල දස්සන දහම් පාසලේ දෙමාපියකුගේ සිතුවිල්ලක්

ලන්ඩන් නුවර උපන් සහ පදිංචි වී සිටින, අපගේ දූ දරුවන්ට බුද්ධාගම, සංස්කෘතිය සහ අපේකම ගැන ඉගෙන ගැනීම එතරම් පහසු කටයුත්තක් නොවේ.

දෙමාපියන් විදිහට අපේ දරුවන්, යහපත් දරුවන් කිරීම අපගේ පරම යුතුකම සහ වගකීමයි. මගේ දූවරුන් දෙදෙනාම අතුල දස්සන දහම් පාසලේ ඉගෙනුම ලබනවා. දහම් පාසලේ අධ්‍යාපන කටයුතු සේම, සංස්කෘතික කටයුතු වලටත් මගේ දරුවන් බොහෝම සතුටින් සහභාගි වෙනවා.

මෙම මහඟු මග පෙන්වීම කරන අපගේ ගරු ස්වාමීන් වහන්සේටත්, ගුරු මඩුල්ලටත් මම ඉතාම කෘතඥ වෙනවා.

ස්තුතියි.
ලාල් සිල්වා

### ස්වාමීන් වහන්සේලා වන්දනා කරන ගාථාව

සීල වන්තං ගුණ වන්තං
පුඤ්ඤක්ඛෙත්තං අනුත්තරං
දුල්ල භේන මයා ලද්දං
බුද්ධ පුත්තං නමාමහං

ATHULA DASSANA DHAMMA SCHOOL
153A, Sutton Lane, Hounslow. TW3 4JW
Tel : 02079980713
e-mail : info@athuladassanatemple.org
nirma_perera@yahoo.com